ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව

පස්වන මට්ටම - **2021/2022**

පරිපාලන නීතිය

**LLU 5709/LWU 3311**

කාලය - පැය තුනයි **(03)**

---

දිනය: **2023.01.12** වේලාව - පෙ.ව. **9.30**- ප.ව **12.30**

---

මුලු ප්‍රශ්න ගණන -**08**
ප්‍රශ්න පහකට **(05)** පමණක් පිලිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

(1) භූගර්භ සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනු පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත කල ව්‍යවස්ථාපිත ආයතනයකි. ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය, කැණීම, පිරිපහදුව, ප්‍රවාහනය, වෙලඳාම හා අපනයනය යන කටයුතුවලට අදාල බලපත්‍ර නිකුත් කිරීමේ බලය මෙම කාර්යාංශය සතුව තිබේ. බලපත්‍ර නිකුත් කිරීමට අදාලව පනත මගින් ප්‍රතිපාදන දක්වයි.

29 (අ) වගන්තිය: කාර්යාංශයට බලපත්‍ර නිකුත් කල හැක්කේ පනත යටතේ ස්ථාපිත කල ව්‍යවස්ථාපිත ආයතනයක් වන සමීක්ෂණ හා පතල් මණ්ඩලයේ වාර්තාවක් ලබා ගැනීමෙන්පසුව පමණි.

29 (ආ) වගන්තිය: රජයේ නිලධාරියෙක් හෝ පලාත් සභාවක හෝ පලාත් පාලන ආයතනයක සේවකයෙක් වන පුද්ගලයෙක්ට ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය, කැණීම, පිරිපහදුව, ප්‍රවාහනය, වෙලඳාම හා අපනයනය යන කටයුතුවලට අදාල බලපත්‍ර නිකුත් නොකල යුතුය.

40 වගන්තිය: කාර්යාංශයේ තීරණය අවසානාත්මක වන අතර අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්නගත කල නොහැක.

මෑතක දී ලියාපදිංචි කල ඛණිජ ද්‍රව්‍ය අපනයන සමාගමක හිමිකරු වූ ගාමිණී රොසැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන අක්කර විස්සක ප්‍රමාණයක තම ඉඩමකට අදාලව ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය හා අපනයනය සඳහා බලපත්‍රයක් ලබාගැනීම වෙනුවෙන් අයැදුම් කලේය. කාර්යාංශයේ අධ්‍යක්ෂකවරයා හේතු දැක්වීමකින් තොරව බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කලේය. කෙසේ වුවද, ගාමිණීට පසුව දැනගන්න ලැබුණේ කාර්යාංශය රොසැල්ල ප්‍රාදේශීය සභා සභාපතිට අයත් යාබද ඉඩමට අදාලව පනතේ 29 වගන්තියට පටහැණි ලෙසකට බලපත්‍රයක් නිකුත් කොට තිබෙන බවයි. පනතේ ප්‍රතිපාදන අනුව, ගාමිණී සතුව පවතින ප්‍රතිකර්ම කවරේදැ'යි ඔහුට උපදෙස් දෙන්න.

පරිපාලන නීති මූලධර්ම හා විනිශ්චිත නඩු තීරණ ඇසුරින් ඔබගේ පිළිතුර සාකච්ඡා කල යුතුය.

(ලකුණු 20)

(2) (අ) සර්ටියෝරාරි ආඥාවක නිශ්චිත සීමා කවරේදැ'යි කිසිවිටෙක නියත වශයෙන් නිශ්චය කොට නොමැත. මේ වනවිට, එහි පරාසය සැලකිය යුතු ලෙසකට පුළුල් වී තිබෙන අතර, නීතිය තුල මනා ලෙස පිළිගැනීමට ලක්ව තිබේ.

R v Electricity Commissioners නඩුවේ දී ඇට්කින් සාමිවරයා විසින් ස්ථාපිත කල සර්ටියෝරාරි ආඥාවක් ලබාගැනීම සඳහා තෘප්ත කල යුතු කොන්දේසි සම්බන්ධ මෑතකාලීන වර්ධනයන් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර සම්පාදනයේ දී විනිශ්චිත නඩු තීරණ ආධාර කරගන්න. (ලකුණු 15)

(ආ) අධිකරණ විසින් රිට් ආඥා නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන පදනම් කවරේදැ'යි සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර සම්පාදනයේ දී විනිශ්චිත නඩු තීරණ ආධාර කරගන්න. (ලකුණු 05)

(3) (අ) 2020.06.22 දා සිට බලපවත්වන ලෙසට, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් විසින් සහන්ව ගල්කඩුව ජාතික පාසැලේ ඉංග්‍රීසි භාෂා සහයක ගුරුවරයෙක් ලෙස පත් කරන ලදී. පාසල් සංවර්ධන සමිතියේ ලේකම් විසින් කල පැමිණිල්ලක් මත ඔහුට එරෙහි මූලික පරීක්ෂණයක් ආරම්භ කෙරුණි. සහන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා දකුණු පලාතේ අධ්‍යාපන කටයුතු ලේකම් විසින් විමර්ශන කමිටුවක් පත් කෙරිණ. ගල්කඩුව ජාතික පාසැලේ විදුහල්පති ඇතුලු තිදෙනෙක්ගෙන් මෙම කමිටුව සමන්විත විය. 2022.04.04 දින විමර්ශනය පැවැත්වීමට කමිටුව තීරණය කලේය. විමර්ශනය දවසේ පාසල් සංවර්ධන සමිතියේ ලේකම් විමර්ශන කමිටුවේ සභාපති සමග ඔහුගේ කාමරයේ සාකච්ඡා කරනු තමුන් දුටු බවට සහන් චෝදනා කරයි. විමර්ශනයෙන් පසුව, දකුණු පලාතේ අධ්‍යාපන ලේකම් සහන්ට එරෙහිව විනය නියෝගයක් නිකුත් කලේය. මෙම නියෝගය මත පදනම්ව, සහන්ගේ සේවය 2022.06.06 දා සිට බල පැවැත්වෙන ලෙස අවසාන කරන ලදී. චෝදනා දොලහෙන් දහයකට ඔහු වැරදිකරු ලෙස තීරණය විය.

ඉහත කී සිදුවීමේ නෛතික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

කමිටුවේ තීරණය අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක්කල හැකිදැ'යි සහන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 15)

(ආ) පක්ෂපාතීත්වය නිර්ණය කිරීම සඳහා භාවිතා කෙරෙන පරීක්ෂණ ගණනාවක් තිබේ. මෙම පරීක්ෂණ භාවිතා කිරීම සම්බන්ධ ශ්‍රී ලංකාවේ අධිකරණ ප්‍රවේශය සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර සම්පාදනයේ දී විනිශ්චිත නඩු තීරණ ආධාර කරගන්න. (ලකුණු 05)

(4) (අ) ශ්‍රී ලංකාව තුල ප්‍රකාශන ආඥාවලට අදාල අධිකරණ බලය පිළිබඳ විවාදාත්මක කරුණු විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 05)

(ආ) 'මෑත වර්ෂවල ප්‍රකාශන ආඥා සම්බන්ධ නඩු තීරණ පරිපාලන නීතිය තුල වැඩි වශයෙන් යොදාගෙන තිබෙන නමුදු, එහි පවතින සැලකිය යුතු වාසිදායක තත්වයන් අගය කල හැකි වන ලෙසකට මෙම ප්‍රතිකර්මය තවමත් ප්‍රමුඛ තත්වයක් අත්කරගෙන නොමැත'.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? ප්‍රකාශන ආඥා සමග සංසන්දනය කරන විට, පොදු නීතිය (public law) තුල වන ප්‍රතිකර්මවල අවාසි කවරේදැ'යි විමසන්න. (ලකුණු 15)

(5) (අ) පහත නියෝගවල වලංගුතාවය සාකච්ඡා කරන්න. ඔබගේ පිලිතුර ඉදිරිපත් කිරීමේ දී පරිපාලන නීති මූලධර්ම හා විනිශ්චිත නඩු තීරණවල ආධාරය යොදාගත යුතුය.

(i) රට තුල වන විකාශන සේවා නියාමනය කිරීම සඳහා අයිස්ලන්තයේ පාර්ලිමේන්තුව ජාතික විකාශන අධිකාරී පනත සම්මත කලේය. පනතේ 20 වන වගන්තිය දක්වන්නේ පෞද්ගලික විකාශන ආයතනයක බලපත්‍රය අහෝසි කිරීමකට අදාල සෑම අභියාචනා අයැදුම් පත්‍රයක්ම එලෙස අහෝසි කිරීමෙන් මාසයක් ඇතුලත අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු බවයි. යට කී පනත යටතේ ස්ථාපිත කල ජාතික විකාශන අධිකාරිය (NBA) පනතේ 20 වන වගන්තියට පටහැණි ලෙස අදාල අභියාචනා බලපත්‍ර අහෝසි කිරීමෙන් සති දෙකක කාලයක් තුල ගොනු කල යුතු බවට රෙගුලාසියක් පනවයි.

(ii) නිවුලන්ඩ්හි රේගු ආඥා පනතේ 30 වගන්තිය ආනයනය කරන විද්‍යුත් වාහනවල වටිනාකම රුපියල් මිලියන අට ඉක්මවන අවස්ථාවල ඒ මත ගාස්තුවක් අය කිරීම සඳහා රේගු බදු අධ්‍යක්ෂක වෙත බලය පවරා දී තිබේ. 2022 ඔක්තොම්බර් සිට ක්‍රියාත්මක වන ලෙස යට කී ගාස්තුව සියයට 20 කින් ඉහල නැංවීමට අධ්‍යක්ෂක ජෙනරාල්වරයා නියෝගයක් නිකුත් කරයි.

(06x 2= ලකුණු 12)

(ආ) '...ව්‍යවස්ථාදායකයට අදාල ප්‍රජාතන්ත්‍රවාදී සුපරීක්ෂණයන් අභිනියෝජන ව්‍යවස්ථා සම්බන්ධව දක්නට නොලැබේ. මේ නිසා මෙම ක්ෂේත්‍රයට අදාලව යම් යම් පාලනයන් හා සුපරීක්ෂාවන් පැවැතීම අවශ්‍ය වේ.'

*M.P.Jain & S.N.Jain Principles of Administrative Law(6th edi.2010)*

පරිපාලන නීති මූලධර්ම හා විනිශ්චිත නඩු තීරණ අනුසාරයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(6) වෙනත් කරුණු අතර ප්‍රදේශයේ ස්වභාවික සම්පත් හා පාරිසරික උරුමයන් සංරක්ෂණය හා ආරක්ෂාව සඳහා වූ බලතල කොස්ගොඩ නගර සභාව වෙත පවරා දී තිබේ. කොස්ගොඩ ගම්මානය පිහිටා තිබෙන්නේ කොස්ගොඩ වැව හා ගංගාව අසබඩය. පහත කරුණු සම්බන්ධව අවධානය යොමු කරන ලෙසට ඉල්ලමින්, කොස්ගොඩ ගම්වාසීන් අවස්ථා කීපයක දී නගර සභාව වෙත ලිඛිත ඉල්ලීම් සිදු කොට තිබේ.

අ) ගං ඉවුරේ සිදු කරන, කොස්ගොඩ වැව් පද්ධතියට හා එහි ජෛව විවිධත්වයට බරපතල තර්ජනයක් බවට පත්ව තිබෙන, නීති විරෝධී වැලි ගොඩ දැමීම හා අවසර නොලත් හෝ නීති විරෝධී ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම තහනම් කිරීම.

ආ) අධික වර්ෂා සහගත දිනවල වැසි වතුර උරා ගනිමින්, එය ස්වභාවික අපවහන පද්ධතියක් තුලින් බැහැර කරමින් ගංගාව අවට වූ තෙත් බිම් විසින් සිදුකරන වැදගත් කාර්යය හේතු කොට ගෙන, කොස්ගොඩ ගංගාව අවහිර වන ලෙසට කෙරෙන අනවසර ඉදිකිරීම් නතර කිරීමට යෝග්‍ය පියවර ගැනීම.

ඇ) කොස්ගොඩ ගංගාවේ සංරක්ෂිත ප්‍රදේශවල අනවසරයෙන් පදිංචිව සිටින හෝ භුක්තියේ සිටින පුද්ගලයන් ඉවත් කිරීම සඳහා නියෝග කිරීම.

කෙසේ වුවද, මේ වන තෙක්, ඉහත කී කරුණු සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නගර සභාව ගෙන නැත. නගර සභාවට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයක් ගත හැකිදැ'යි කොස්ගොඩ වැසියන් ඔබගෙන් උපදෙස් පතයි. ඔවුන්ට උපදෙස් දෙන්න. අදාල නෛතික අධිකාරීන් මගින් පිලිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

(7) 'නූතන පරිපාලන නීතිය තුල සීමාරහිත අභිමතය පිලිබඳ සංකල්පය වලංගු නොවේ'

- *Gunatileka v Weerasena 2000 (2)Sri L.R 1*

පරිපාලන අභිමතය පාලනය කිරීමේ ක්ෂේත්‍රය තුල අධිකරණ විසින් වර්ධනය කල අදාල මූලධර්ම ආශ්‍රිතව ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(8) පාරිභෝගික කටයුතු අධිකාරිය (CAA) යනු ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් පනතක් මගින් ස්ථාපිත කල ව්‍යවස්ථාපිත ආයතනයකි. පුලුල් පරාසයකට අයත් නිෂ්පාදන හා සේවාවලට අදාල පැමිණිලි භාරගැනීමට හා විමර්ශනය කිරීමට අදාල බලතල මෙම අධිකාරිය සතුව පවතී. ඕනෑම භාණ්ඩයක් නිෂ්පාදනය, සැකසුම, සැපයුම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සහ ඕනෑම සේවයක් සැපයීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් සකස්කල ප්‍රමිතීන්ට හා නියමයන්ට අනුකූල නොවන අවස්ථා පිලිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල ද මෙම අධිකාරිය සතුව තිබේ. පනත තවදුරටත් මෙසේ සඳහන් කරයි :

(අ) භාණ්ඩ හා සේවාවල පවතින අඩුපාඩු නිසා හානියට පත්වන පාරිභෝගිකයන්ට වන්දි ගෙවීමේ බලතල පාරිභෝගික කටයුතු අධිකාරිය සතු වේ. මෙලෙස වන්දි ගෙවිය හැක්කේ පනත විසින් ස්ථාපිත කල ව්‍යවස්ථාපිත ආයතනයක් වන උපදේශක කමිටුවේ තාක්ෂේරු වාර්තාවක් ලබාගැනීමෙන් පසුව පමණකි.

(ආ) වන්දි ගෙවීම සම්බන්ධව අධිකාරියට තිබෙන බලය අවසානාත්මක බවත් කිසිදු අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්න කල නොහැකි බවත් පනතේ 12 වගන්තිය දක්වයි.

ශ්‍රී ලංකාව තුල ගෑස් පිපිරීම් මාලාවක් වාර්තා විය. සිලින්ඩර්වල තිබෙන ගෑස් සංයුතිය පිලිබඳ පැමිණිලි අධිකාරිය වෙත ලැබුණි. ගෑස් සිලින්ඩර් පිපිරීම්වලට පසුව, වන්දි ගෙවීම සඳහා වැඩපිලිවෙලක් අධිකාරිය විසින් හඳුන්වා දෙන ලදී.

සිලින්ඩර් පිපිරීම නිසා අර්ධ වශයෙන් නිවස විනාශයට ලක්වූ ගෑස් පිපිරීම්වල වින්දිතයෙක් වූ බණ්ඩාර තම නිවස යලි ගොඩනැගීමේ අරමුණින් වන්දි ඉල්ලමින් අයදුම් පතක් යොමු කලේය. උපදේශක කමිටුවේ වාර්තාවක් ලබා නොගෙන, අධිකාරියේ සභාපතිවරයා අදාල අයැදුම් පත්‍රය ප්‍රතික්ෂේප කලේය. තම තීරණය අවසානාත්මක හා තීරණාත්මක බව අධිකාරිය පවසයි.

සභාපතිගේ තීරණය අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කල හැකිද යන්න පිලිබඳ බණ්ඩාර ඔබගේ උපදෙස් පතයි.

ශ්‍රී ලන්තයේ අර්ථනිරූපන පනත 1972 අංක 18 දරන ශ්‍රී ලංකාවේ අර්ථනිරූපණ (සංශෝධන) පනතට සමාන බව සලකමින් ඔහුට උපදෙස් දෙන්න. ඔබගේ පිලිතුර විනිශ්චිත නඩු තීන්දු මගින් සනාථ කල යුතුය. (ලකුණු 20)

***හිමිකම් ඇවිරිණි****